


ලද්දුව කුකුළන් ඇති කිරීමේ සමිතියේ සාමාජික සාමාජිකාවෝ පළාතේ කෘෂිකර්ම උපදේශක මහතා සමඟ.

# සමූපකාර ක්‍රමයට කෙරෙන කුකුළු ව්‍යාපාරය

**හැඳින්වීම :** කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවලට පමණක් දැනට සීමා වී ඇති සමූපකාර කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරය ලංකාවේ මෑතකදී ආරම්භ කරන ලද ජනප්‍රිය ගොවි කටයුත්තකි. මෙයිනුදු කළුතර දිස්ත්‍රික්කයේ වැලිපැන්න කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් අනුව අරඹන ලද අද දියුණු අඩියක ඇති ලද්දුව සමිතිය දැක ගැනීමේ භාග්‍යය අපි ලද්දෙමු.

**පිහිටීම :** බොදුවෝ වෙසෙන සාමාන්‍ය ගම්බද පරිසරයක එක් අතෙකින් සාරවත් වෙල් යායක්ද ඇති ලද්දුව සමිතියේ ධෛර්යවත් සාමාජිකයන් සතු අඩි (21×12) ප්‍රමාණයේ සිත් පහදින "ඩිපිලීටර්" කුකුළු ගෙවල් දහඅට ගමේ තැනින් තැන පොල් රුප්පා මැද ඇති කුඩා කූඩාරම් වැනිය. මෙවැනිම තවත් කූඩු 17ක්, ඇති "මීගම" නමැති ගමේ සමිතියද කූඩු 21 ක්, ඇති ඉත්තෑපාන නැමැති ගමේ ඇති සමිතියද දියුණු තත්වයක ඇති බැව් කෘෂිකර්ම උපදේශක මහතා අතින් දැන ගන්නට ලැබුණි. මෙම සමිතිය 1965 අප්‍රේල් මාසයෙහි ඇරඹූ අතර, ලියාපදිංචි කරන ලද්දේ 1965 මැයි 31 වැනිදාය.

**ඇති කරන වර්ගය :** බිත්තර සඳහා කුකුළන් ඇති කරන නිෂ්පාදකයින් දූන් දූන් වැඩිපුර ඇති කරනුයේ දෙමුහුන් වර්ගයි. ඒ අනුව ලද්දුව සමිතියේ සාමාජිකයින් විසින් ඇති කරනුයේ "හයි-ලයින්" නමැති දෙමුහුන් කුකුළු වර්ගයයි. මේ අතර මීගම හා ඉත්තෑපාන සමිතිවල " සයික්ස් " දෙමුහුන් වර්ගය ඇති ඇඩි කරන බැව් කෘෂිකම් උපදේශක මහතාගෙන් දැන ගන්නට ලැබුණි. සාමාන්‍ය ගම්බද කිකිළියකගෙන් වසරකට බිත්තර 60-80 දක්වා ප්‍රමාණයක් බලාපොරොත්තු විය හැකි නමුදු මෙම උසස් දෙමුහුන් ආරයන්ගෙන් වසරකට බිත්තර

250කට, වඩා බලාපොරොත්තු විය හැක. තවද, සමිතියේ සභාපති එල්. විල්සන් සිල්වා මහතා දැනවූ පරිදි ඊළඟ වාරයේ ඔවුන් දුඹුරු බිත්තර දමන දෙමුහුන් නව කුකුළු වර්ගයක් ඇති කිරීමට බලාපොරොත්තු වෙති. ඒ දුඹුරු බිත්තරවලට වඩා හොඳ අලෙවියක් ඇති බැවිනි. සාමාන්‍යයෙන් ගම්බද අයට දිනක් වයසැති කුකුළු

**වියදම:** කුකුළු නිවාස 18 සඳහා මුදල් වියදම් වූ අයුරු පළමුවෙනි චක්‍රයෙන් පැහැදිළි වෙයි. ඒ අනුව එක නිවසකට රු. 464.70 ක, මුදලක් වැය වී ඇත. දෙවෙනි චක්‍රයේ මුළු වියදම 18 න් බෙදුවිට කෑම බඳුන් වැනි උපකරණ සඳහා එක් නිවසකට රු. 65 ක, මුදලක් වියදම් වී ඇත. තුන්වන චක්‍රයෙන් පෙන්වා දෙන ගණන් අනුව



ලද්දුව සමිතියේ එක් සාමාජිකාවගේ "ඝන ආස්තරණ" කුකුළු ගෙයි දෙමුහුන් කිකිළියන්ට ආහාර දුන් අවස්ථාවක් නව කෑම බඳුන් එල්ලා ඇති අයුරු බලන්න.

පැටවුන් ඇති කිරීමේ වරය ඇති නමුදු සමිතිවල මසක් වයසැති පැටවුන් ඇති කළ යුතුයයි නීතියකි.

**මුදල් ආධාර හා ආපසු ගෙවීම:** මෙම සමිතියේ සාමාජිකයින් 18 දෙනා එදිනෙදා කුලී වැඩ කරන ගම්බද අයවළුන් වූහ. එබැවින් මෙවැනි ව්‍යාපාරවල යෙදවීමට ඔවුනට වත් පොහොසත්කම් නොවීය. ඒ අනුව ඔවුනට ව්‍යාපාරයේ මූලික ධනය වශයෙන් රු. 1500ක, ණය මුදලක් මහජන බැංකුවෙන් ලැබිණ. සමිතිය විසින් මෙම ණය මුදල අවුරුද්දක් තුළ වාර දොළහකින් ආපසු මහජන බැංකුවට ගෙවිය යුතු විය.

මුළු සමිතියටම බෙහෙත් ආදිය සඳහා වූ මුළු වියදම පෙනේ. 4 වන හා 5 වන චක්‍රවලින් කුඩු දෙකක කිකිළියන් බිත්තර දමා ඇති අයුරු පෙනේ.

සමිතිය විසින් මිළයට ගත් මාසයක් වයසැති පැටව් 1800 යේ වටිනාකමට සියයට 20ක, කොමිස් මුදලක් ව්‍යාපාරිකයෝ දුන් බැවින් එක පැටවෙක් රු. 3.20 බැගින් පැටවු 1800 ට, රු. 5,760 ක්, වියදම් විය.

**බිජු ලෑම සහ ආදායම:** 1965 සැප්තැම්බර් 27 වැනිදා කුඩුවලට දැමූ මසක් වයසැති පැටවු 1966 ජනවාරි 27 වෙනි දින බිජු ලෑම්

ඇරඹුවෝය. ඒ සාමාන්‍යයෙන් මාස 5 ක, පමණ කාල සීමාවක් ඉකුත් වීමෙන් පසුවය. සාමාන්‍යයෙන් කිකිළියකගෙන් මාස $5\frac{1}{2}$ත්-6 ත්, අතර බිත්තර බලාපොරොත්තු විය හැකි නමුදු ලද්දුව සමිතියේ කිකිළියන් මාස 5කින්, බිත්තර දැමීම ඇරඹීම ව්‍යාපාරය දියුණු අඩියකට පත් වීමේ සුභ ලකුණකි. මේ අනුව එක් සාමාජිකයෙක් තමා ගත් ණය මුදල කැපී යාම සඳහා දිනකට බිත්තර 62ක්, සමිතියට දිය යුතු විය. ඒ අනුව සමිතිය විසින් 1966 මාර්තු මාසයේ බිත්තර 33,836ක් ද, අප්‍රේල් මාසයේ බිත්තර 32,456ක් ද, මැයි මාසයේ බිත්තර 33,460 ක් ද, සාමාජිකයින්ගෙන් එකතු කර ගන්නා ලදී. එක සාමාජිකයෙකුට අයත් කූඩුවකින් සාමාන්‍යයෙන් දිනකට බිත්තර 72—78 දක්වා ප්‍රමාණයක් බලාපොරොත්තු විය හැකි බැවින්, ණය මුදල ගෙවන තුරු සාමාජිකයෙකුට ආදායම වශයෙන් දිනකට ඇත්තේ බිත්තර 10—18 දක්වා ප්‍රමාණයක් පමණි. එබැවින් ඔවුහු සාමාන්‍යයෙන් බිත්තරයක් මිළ කරන ශත 18 මුදලට දිනකට රු. 2 ක පමණ ආදයමක් ලබා ගනී. එහෙත් පළමු වසරේ අවසානයේ ණය මුදල ගෙවා අවසාන වූ සාමාජිකයෙකුට සාමාන්‍යයෙන් දිනකට රු. 10 ක පමණ ආදායමක් ලබා ගත හැක.

මේ අනුව මෙම කුකුළු ව්‍යාපාරයෙන් සාමාන්‍ය ගම්බද පවුලකට රු. 300 ක පමණ අමතර ආදායමක් මසකට ලබා ගැනීමට පුළුවන. කලින් රු. 395 කට තිබූ කුකුළු කෑම ටොන් එක දැන් රු. 435 ක් පමණ මිළ වැඩි වී ඇත. එබැවින් ඊට සරිලන සේ ආදායමද අඩු වී ඇත. තවද, බිත්තර නිෂ්පාදනය දියුණු වී ඇති බැවින් ගම්බද තත්ත්වයන් යටතේ බිත්තරයක් ශත 18 කට වඩා මිළ කිරීමටද මෙම සමුපකාර ව්‍යාපාරිකයින්ට නුපුළුවන් වී ඇත.

අපට හැඟී යන පරිදි මුළු ලංකාවේම මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පළමු අඩු මිළට කුකුළු කෑම සැපයීමේ ක්‍රමයක් හා වැඩිපුර නිපදවෙන බිත්තර අලෙවි කිරීමේ ක්‍රමයක් ද ඇති කළ යුතු වෙයි. එතෙක් මුළු රට තුළම මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම පමා කළ යුතුය. එබැවින් මෙම කුකුළන් ඇති කිරීමේ ජනප්‍රිය ක්‍රමය කොළඹ හා කළුතර දිස්ත්‍රික්කයන්ට පමණක් දැනට ක්‍රියාත්මක කර තිබීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගත් දූර දර්ශී පියවරක් බැව් කොයි කාටත් පෙනී යනවා ඇත.

ලද්දුව කුකුළන් ඇති කිරිමෙ සමිතියේ සාමාජික සාමාජිකාවන් කෘෂිකර්ම උපදේශක මහතාගෙන් උපදෙස් ලබා ගත් අයුරු.



## 1 වෙනි වක්‍රය

| | රු. ශ. |
|---|---|
| ලි සඳහා ... ... ... | 3,308 15 |
| වැලි ... ... ... | 70 0 |
| වහලට දමූ ඇළුමිනියම් තහඩු ... | 3,187 40 |
| සිමෙන්ති හො. 18ක් සඳහා ... ... | 207 0 |
| කම්බිදැල් සඳහා (යාර 630) ... ... | 850 50 |
| සරනේරු 18 ... ... | 33 80 |
| කම්බි ඇණ ... ... | 10 80 |
| යකඩ ඇණ රාත්තල් 72 ... ... | 36 0 |
| වහලේ තහඩු සවි කරන කොකු (504 (ලොකු) ... | 100 80 |
| වහල සවි කරන කොකු කුඩා 252 ... | 22 68 |
| දැල් ගැසීමට කොකු රා. 4½ ... ... | 13 50 |
| ඉබි යතුරු 18 ... ... | 57 0 |
| කුණ්ඩි පට්ටම් 18 ... ... | 17 0 |
| කූඩු සෑදීමට කුළිය—එකකට රු. 25 බැගින් කූඩු 18 ට ... ... | 450 0 |
| නිවාස සඳහා මුළු වියදම ... ... | 8,364 63 |

## 2 වෙනි වක්‍රය

| | |
|---|---|
| කෑම භාජන 108ක් සඳහා ... ... | 648 0 |
| අඩි 14ක්, දිග වතුර පීලි 18 ... ... | 252 0 |
| එක නිවාසයට වතුර බඳුන් දෙක බැගින් ටේ 36 ට (එකක් 7.50 බැගින්) ... ... | 270 0 |
| කෑම භාජන ආදියට ගිය මුළු වියදම ... | 1,170 0 |

## 3 වෙනි වක්‍රය

| | |
|---|---|
| ටෙරමයිසින් ඇන්ටිජර්ම බෝ. 18 ... | 304 0 |
| සල්මේට් පයින්ට් 18 ... ... | 43 68 |
| ඔරෝපැක් රාත්තල් 36 ... ... | 83 52 |
| සිරින්ජ් 1යි නීඩල් 2යි ... ... | 6 92 |
| සල්පමෙතසින් සූන සෙන්ටි මීටර් 500 ... | 15 50 |
| මෝර තෙල් ගැලුම් 3 ... ... | 51 0 |
| බෙහෙත් ආදිය සඳහා මුළු වියදම ... | 504 62 |

නිමි

## 4 වන වක්‍රය

### එල්. විල්සන් සිල්වා මහතා

### ලද්දුව කුකුළන් ඇති කිරීමේ සමුපකාර සමිතිය

### ලද්දුව—මීගම

### කේ. එල්. 461

ඇල්. විල්සන් සිල්වා ගොවි මහතාගේ ''ඩීප් ලිටර්'' කුකුළු නිවාසයේ සතුන් බිත්තර දමා ඇති අයුරු

### බිත්තර දැමීමේ සටහන

| දිනය | 1966 අප්‍රේල් | 1966 මැයි | 1966 ජූනි | 1966 ජූලි |
|---|---|---|---|---|
| 1 | 92 | 86 | 85 | 91 |
| 2 | 90 | 81 | 84 | 89 |
| 3 | 93 | 86 | 86 | 83 |
| 4 | 96 | 82 | 91 | 82 |
| 5 | 89 | 81 | 90 | 79 |
| 6 | 90 | 86 | 90 | 89 |
| 7 | 88 | 89 | 84 | 87 |
| 8 | 98 | 89 | 84 | 87 |
| 9 | 92 | 83 | 83 | 83 |
| 10 | 88 | 85 | 83 | 91 |
| 11 | 96 | 86 | 91 | 78 |
| 12 | 88 | 86 | 82 | 79 |
| 13 | 93 | 92 | 87 | 78 |
| 14 | 89 | 83 | 87 | |
| 15 | 93 | 84 | 86 | |
| 16 | 88 | 83 | 91 | |
| 17 | 92 | 83 | 90 | |
| 18 | 93 | 86 | 90 | |
| 19 | 93 | 88 | 88 | |
| 20 | 90 | 89 | 86 | |
| 21 | 92 | 84 | 87 | |
| 22 | 99 | 91 | 85 | |
| 23 | 95 | 88 | 91 | |
| 24 | 89 | 86 | 90 | |
| 25 | 90 | 91 | 83 | |
| 26 | 93 | 89 | 84 | |
| 27 | 88 | 85 | 82 | |
| 28 | 81 | 79 | 80 | |
| 29 | 98 | 86 | 81 | |
| 30 | 85 | 85 | 80 | |
| 31 | — | 91 | — | |
| එකතුව | 2,741 | 2,663 | 2,581 | |

එක් නිවසක සාමාන්‍යයෙන් කිකිළියන් සියයක් ඇත.

5 වන වක්‍රය

කේ. පී. සිරිනෙල් සිල්වා මහතා

ලද්දූව කුකුළන් ඇති කිරීමේ සමුපකාර සමිතිය

ලද්දූව—මීගම

කේ. එල්. 461

කේ. පී. සිරිනෙල් සිල්වා ගොවි මහතාගේ ඩීප්ලිටර් කුකුළු නිවාසයේ කිකිළියන් බිත්තර දමා ඇති අයුරු

බිත්තර දැමීමේ සටහන

| දිනය | 1966 අප්‍රේල් | 1966 මැයි | 1966 ජූනි | 1966 ජූලි |
|---|---|---|---|---|
| 1 | 79 | 71 | 69 | 71 |
| 2 | 78 | 77 | 72 | 68 |
| 3 | 76 | 74 | 73 | 69 |
| 4 | 76 | 73 | 74 | 70 |
| 5 | 75 | 72 | 75 | 70 |
| 6 | 76 | 74 | 76 | 68 |
| 7 | 71 | 71 | 72 | 71 |
| 8 | 74 | 81 | 70 | 72 |
| 9 | 81 | 80 | 71 | 73 |
| 10 | 69 | 68 | 72 | 68 |
| 11 | 75 | 78 | 73 | 67 |
| 12 | 76 | 76 | 71 | 68 |
| 13 | 73 | 73 | 70 | 69 |
| 14 | 81 | 72 | 69 | |
| 15 | 71 | 71 | 72 | |
| 16 | 69 | 70 | 73 | |
| 17 | 79 | 70 | 70 | |
| 18 | 72 | 73 | 69 | |
| 19 | 73 | 72 | 68 | |
| 20 | 74 | 75 | 68 | |
| 21 | 77 | 69 | 69 | |
| 22 | 61 | 68 | 71 | |
| 23 | 73 | 69 | 72 | |
| 24 | 74 | 70 | 74 | |
| 25 | 73 | 71 | 69 | |
| 26 | 75 | 73 | 68 | |
| 27 | 71 | 74 | 69 | |
| 28 | 72 | 75 | 70 | |
| 29 | 81 | 69 | 71 | |
| 30 | 79 | 70 | 72 | |
| 31 | — | 71 | — | |
| එකතුව | 2,232 | 2,250 | 2,133 | |

එක් නිවසක සාමාන්‍යයෙන් කිකිළියන් සියයක් ඇත.